# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No DSD/HO/04/LH/09//2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | දිනය<br>திகதி<br>Date 2021.08.03 |

සියළුම දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන්,
සියළුම සමෘද්ධි සංවර්ධන නිලධාරීන් වෙත.

**සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් ( 200,000 ක්) කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන - 2021**

උක්ත වැඩසටහන යටතේ මේ වන විට විවිධ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභීන් 180,046 ක් තෝරාගෙන ඔවුන් ව්‍යාපෘති ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

02. මෙම ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා වන සමාරම්භක වැඩසටහන මෙම මස 03 වන සතිය තුලදී දිවයින පුරා සෑම ග්‍රාම නිලධාරී වසමක්ම ආවරණය වන පරිදි පැවැත්වීමට නියමිත බැවින් මේ සඳහා අදාල කටයුතු සිදු කරන මෙන් කාරුණිකව දන්වමි.

03. මෙම වැඩසටහන සම්බන්ධයෙන් මාධ්‍ය ප්‍රචාරණ / බැනර් / නාම පුවරු ප්‍රදර්ශනය වැනි සෑම අවස්ථාවකදීම සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය හා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අනන්‍යතාවය පුමුඛ වන අයුරින් කටයුතු සිදුවීම වැදගත් වේ.

04. සමාරම්භක වැඩසටහන් සඳහා විවෘත එළිමහන් ස්ථානයන් තෝරා ගැනීම කාලෝචිත වන අතර සමාරම්භක වැඩසටහන පිළිබඳව දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය, සමෘද්ධි ප්‍රජා මූල බැංකුව සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ස්ථානයන්හි බැනර් ප්‍රදර්ශනය කළ යුතු බව කාරුණිකව දන්වමි. බැනර් සඳහා වන ආකෘතිය ඉදිරියේදී ඔබ වෙත ලබාදීමට කටයුතු කරනු ඇත.

05. මෙම වැඩසටහන යටතේ ස්වේච්ඡාවෙන් සවිබලගැන්වෙන සමෘද්ධිලාභී පවුල් සඳහා ලැබෙන ප්‍රතිලාභයන් ගැන සමෘද්ධි නිලධාරීන් මඟින් නිරන්තරයෙන් දැනුවත් කිරීම අත්‍යාවශ්‍ය වන අතර ලැබෙන ප්‍රතිලාභයන් පිළිබඳ තොරතුරු මේ සමඟ ඇති ඇමුණුම මඟින් ඔබ වෙත ලබාදීමට කටයුතු කරමි.

06. මෙම ව්‍යාපෘති ලක්ෂ 2 වැඩසටහන සඳහා විභවයක් පවතින, අදාල නිර්ණායකයන් සපුරාලන අඩු ආදායම්ලාභී ප්‍රජාව ද සම්බන්ධ කර ගැනීමට ඔබගේ අවධානය යොමු කිරීම අවශ්‍ය වනු ඇත. සුදුසුකම් සපුරාලන අඩු ආදායම්ලාභීන් මෙම වැඩසටහන පිළිබඳව දැනුවත්වීම නිසි පරිදි සිදු නොවන අවස්ථාවන් පිළිබඳ වාර්තා වී ඇති බැවින් මේ පිළිබඳව සුදුසු පියවර ගන්නා මෙන් කාරුණිකව දන්වමි.

මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට ඔබ සියළු දෙනා මෙතෙක් දක්වන ලද සහාය අගය කරන අතර ඉදිරියේදී මෙම කාර්යය සාර්ථක කර ගැනීමට ඔබ සියළු දෙනාගේ දායකත්වය බලාපොරොත්තු වෙමි.

Covid -19 වසංගත තත්ත්වය දක්වා වර්ධනය වීම පාලනයට සෞඛ්‍ය, ආරක්ෂක අංශ ලබාදී ඇති උපදෙස් අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ යුතු බව ද කාරුණිකව දන්වමි.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :- 1. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. ලේකම්, ජාතික ජීවනෝපාය සම්බන්ධීකරණ අනු කමිටුව -කා.දැ.ගැ.ස.
3. ප්‍රධාන මෙහෙයුම් නිලධාරී, ආර්ථික පුණර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධන බලකාය - කා.දැ.ගැ.පි. හා අ.ක.ස.

:. Senaka


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

ඇමුණුම

**සමෘද්ධි පවුල් ලක්ෂ දෙකක් ( 200,000 ක්) කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන - 2021**

**දිවිනැගුමට සමෘද්ධි අපේක්ෂා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන**

**ස්වේච්ඡාවෙන් සවිබලගැන්වෙන හා ඉදිරියේදී මෙම වැඩසටහන යටතේ ආර්ථිකමය වශයෙන් සවිබලගැන්වීමට කැමැත්තක් දක්වන ප්‍රතිලාභීන් සඳහා ලබාදීමට අපේක්ෂිත ප්‍රතිලාභ.**

- සමෘද්ධි සවිබල රන් සහතිකය (Gold Certificate) සමඟ සමෘද්ධි සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ රු. 420.00 ක දායකත්ව සීමාවේ රැඳී සිටීමට හැකිවීම.

- සමෘද්ධි සවිබල විශේෂ ණය යෝජනා ක්‍රමය.
  - 4% ක් වූ වාර්ෂික පොළී ණය ප්‍රතිශතයක් යටතේ රුපියල් ලක්ෂ 05 ක ණය පහසුකම් ඔවුනගේ ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබාදීම.
  - 7% පොළී අනුපාතය යටතේ රු.මි. 2.0 ක් දක්වා සමෘද්ධි ප්‍රජා මූල බැංකු ණය ලබාගත හැකිවීම.

- සමෘද්ධි සවිබල දායක විශ්‍රාම වැටුප් ක්‍රමයට සම්බන්ධ කිරීම.

- සමෘද්ධි බැංකුව විසින් ලබාදෙන සහන එලෙසින්ම හිමිවීම.

- ගමේ අවශ්‍යතාවය අනුව ප්‍රතිලාභීන් තෝරා ගැනීමට හැකිවීම.